මගේ අංකය
எனது இல.
My No.
VV/4/2/4/7/11/12/14

ඔබේ අංකය
உமது இல
Your No.

දුරකතනය 2853615
தொலைபேசி 2853777
Telephone 2856261
2856262

ආසන අංකය:

තැපැල් පෙට්ටිය 21
නාවල
නුගේගොඩ

தபால் பெட்டி 21
நாவல,
நுகேகொட

Post Office Box 21
Nawala,
Nugegoda

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
# இலங்கை திறந்த பல்கலைக்கழகம்
# THE OPEN UNIVERSITY OF SRI LANKA

2021 දෙසැම්බර් මස 20

**2022 ජනවාරි මස 06 වන දින    02 වන සැසිය    උදය වරුව**

ගරු ස්වාමීන් වහන්ස/ පූජකතුමනි
ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියනි / මෙනවියනි,

**<u>උපාධි උත්සවය</u>**

**<u>නීතිවේදී උපාධිය</u>**

ඉහත සඳහන් උපාධි උත්සවය කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) **2022 ජනවාරි මස 06 වන දින පෙ.ව 11.30** ට පැවැත්වීමට නියමිත ය.

උපාධි උත්සවය සාර්ථක කර ගැනීම සඳහා පහත දැක්වෙන උපදෙස් මැනවින් පිළිපැදිය යුතු බව කරුණාවෙන් සලකන්න.

01. 2022 ජනවාරි මස 06 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට පැමිණෙන විට සහ උපාධි ලෝගු ලබා ගැනීම ආදී කාර්යයන් සඳහා ජාතික හැඳුනුම්පත සහ ශිෂ්‍ය වාර්තා පොත අනිවාර්යයෙන්ම රැගෙන ආ යුතුය.

02 ඔබගේ අංකය

අපේක්ෂක පෙරහැරෙහි ඔබ ගමන් කළ යුතු ස්ථානය, ලෝගුව, හිස්වැස්ම ලබා ගැනීම හා ආපසු බාරදීම, සහතික පත ලබා ගැනීම ආදී උපාධි උත්සවයට අදාළ සියළු කාර්යයන්හි දී ඔබ හඳුන්වනු ලබන්නේ ඔබ වෙත මේ සමඟ නිකුත් කරන ප්‍රවේශ පත්‍රයෙහි දක්වා ඇති ඉහත සඳහන් අංකයෙනි. එම නිසා උපාධි උත්සවය සම්බන්ධ සියලු කටයුතු වලදී එම ප්‍රවේශ පත්‍රය ඔබ ලඟ තබා ගත යුතුය.

03 ලෝගුව/බාපනය/හිස් වැස්ම ලබා ගැනීම :

ලෝගුව/ බාපනය /හිස් වැස්ම නිකුත් කිරීම ඔබ වෙත යොමු කරන ලද ගූගල් පෝරමයට (Google form) ලබා දුන් ප්‍රතිචාර මත නාවල පිහිටි විභාග අංශය සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන හරහා පහත පරිදි සිදු කෙරේ.

- විභාග අංශය, නාවල ප්‍රධාන කාර්යාලය 2021 දෙසැම්බර් 29, 30, 31 සහ 2022 ජනවාරි මස 02 දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන 2021 දෙසැම්බර් 29, 30, 31 සහ 2022 ජනවාරි මස 01 දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා ( ප්‍රාදේශීය මධ්‍යස්ථාන හරහා ලබා ගැනීමට පෙර අයදුම්කර ඇත්නම් පමණි)

මුදල් තැන්පත් පත්‍රිකාව සමඟ නිකුත් කිරීමේ අයදුම්පත ඉදිරිපත් කර ලෝගුව/ බාපනය /හිස් වැස්ම ලබාගත හැකිය. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු මෙම ලිපිය සමඟ අමුණා ඇත.

04 ඡායාරූප ලබා ගැනීම සඳහා මුදල් ගෙවීම පහත පරිදි සිදු කළ හැකිය.

- කොළඹ සහ මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානයන් හිදී 2021 දෙසැම්බර් 29, 30 සහ 31 දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුල ගෙවීම් කළ හැකිය.
- නැතහොත් උපාධි උත්සවය පවත්වනු ලබන බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ඉදිරිපිට පිහිටි සුදර්ශි ශාලාවේ ස්ථාපනය කර ඇති විශ්වවිද්‍යාලයේ ගෙවීම් කවුන්ටරයද මුදල් ගෙවිය හැකිය. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු මෙම ලිපිය සමඟ අමුණා ඇත.

05 ලෝගුව/බාපනය/හිස් වැස්ම ආපසු භාරදීම උපාධි උත්සවයෙන් පසු බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සිදු කළ හැකිය. නැතහොත් 2022 ජනවාරි මස 07,08 සහ 11 දිනයන් හිදී පෙ. 09.00 සිට ප.ව. 03.00 දක්වා නාවල, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ විභාග අංශයට ගෙනවිත් භාරදිය හැකිය. ලෝගුව/බාපනය/හිස් වැස්ම භාර දුන් පසු තැන්පත් මුදල ගෙවනු ලැබේ. නියමිත දිනට ලෝගු භාරදීමට අපොහොසත් වන්නේ නම් තැන්පත් මුදල රඳවා ගැනීමට කටයුතු කරනු ඇත.

06 පෙරහුරුව හා පෙරහැර :

උපාධි උත්සවයේ පෙරහුරුවක් නොපැවැත්වේ. එබැවින්, උපාධි උත්සවයේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා **2022 ජනවාරි මස 06 වන දින පෙ.ව 10.30** ට බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා භූමියේ ප්‍රධාන ශාලාව අසලට පැමිණ ඔබගේ අංකය අනුව පෙරහැර සඳහා පෙළ ගැසිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ ඔබට වෙන් කර ඇති ස්ථානය හෝ අංකය වෙනස් නොකළ යුතුය.

07 ප්‍රවේශ පත්‍ර :

2022 ජනවාරි මස 06 වන දින උපාධි උත්සවයට සහභාගී වීම සඳහා ඔබට එක් ප්‍රවේශ පත්‍රයක් ද අමුත්තන් සඳහා එක් ප්‍රවේශ පත්‍රයක් ද, රථවාහන අවසර පත්‍රයක් ද මේ සමග එවා ඇත. වයස අවුරුදු 8 න් පහළ ළමුන් ශාලාව තුළට ඇතුල් කිරීමට අවසර දෙනු නොලැබේ. ජංගම දුරකථන, කැමරා හෝ ඉලෙක්ට්‍රොනික උපකරණ ශාලාව තුළට රැගෙන යාම තහනම්ය.

උපාධි උත්සවයට ඔබ සමග පැමිණෙන අමුත්තන් අසුන් ගැනීමෙන් පසු කිසිදු අවශ්‍යතාවයක් සඳහා උත්සවය අවසාන වනතෙක් උත්සව ශාලාවෙන් නැගිට යාමට අවකාශ නොමැත. සියලුම උපාධිධාරීන් සහ පැමිණෙන අමුත්තන් අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ජාතික හැඳුනුම්පත්‍රයේ ආකාරයට පැහැදිලි ලෙස මුහුණ හඳුනා ගැනීමට හැකි වන සේ සිටිය යුතුය.

08 ඡායාරූප ගැනීමේ තහනම :

උපාධි උත්සව ශාලාව තුළ ඡායාරූප ගැනීම තහනම් වන අතර, කිසිඳු හේතුවක් නිසා ඡායාරූප උපකරණ ශාලාව තුළට රැගෙන යාමද සම්පූර්ණයෙන් තහනම් ය.

09 ආචාරශීලී බව :

ආචාර්යවරුන් හා නිලධාරීන්ගෙන් සමන්විත පෙරහැරට අනතුරුව පැමිණෙන කුලපතිතුමාගේ පෙරහැර ශාලාව තුලට පිවිසෙන විට ශාලවේ සිටින සියලුදෙනා නැගී සිටිය යුතුය. උපාධි උත්සවය අවසන්වන තුරු කිසිවකු ශාලාවෙන් පිටතට නොයා යුතුය.

උපාධි උත්සවය අවසන් කිරීමට කුලපතිතුමා නැගී සිටින විට සියලුදෙනාම නැවත තම අසුන් වලින් නැගිට කුලපතිතුමා ශාලාවෙන් පිටව යන තුරු එසේ සිටිය යුතුය.

උපාධි උත්සව ශාලාවේ දී උපාධිධාරීන්ගේ නම් අනුපිළිවෙලට කියවනු ලැබේ. (උපාධි උත්සවයේදී ඔබ වෙත ලබා දෙන නාම ලේඛනය අනුව) ඔබගේ නම කියවීමට පෙර අසුනෙන් නැගිට වේදිකාවට පිවිසීමට ඇති පියගැටපෙළ අසල පේලි සැදී සිටිය යුතුය. ඔබගේ නම කියවුනු විට ඉතා සංවර ලීලාවෙන්, විනීතව කුලපතිතුමා ඉදිරියට ගොස් උපාධි මංජුසාව පිරිනැමූ පසු හිස නමා ආචාර කොට ආපසු පැමිණ ඔබට නියමිත අසුනේ අසුන්ගත යුතුය.

10 ඇඳුම

පිරිමි උපාධිධාරීන් ජාතික ඇඳුමෙන් හෝ කබායක් හා ටයිපටියක් ද සහිත බටහිර පන්නයට හෝ සැරසී සිටිය යුතුය. කාන්තා උපාධිධාරීන් වර්ණවත් සාරියකින් සැරසී සිටිය යුතුය. බෞද්ධ භික්ෂූන් වහන්සේලා හැර සෙසු සියලුම උපාධිධාරීන් තමාට අදාල ලෝගුවෙන් සැරසී සිටිය යුතුය. පශ්චාත් උපාධිධාරීන් දුඹුරු පැහැති ලෝගුවෙන්ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් කළු පැහැති ලෝගුවට අමතරව බාපනයකින් සැරසී සිටිය යුතු අතර සෙසු උපාධිධාරීන් කළු පැහැති ලෝගුව සහ හිස් වැස්ම පැළඳ සිටිය යුතුය.

11 සමූහ ඡායාරූපය

උපාධි උත්සවය අවසන් වූ වහාම සමූහ ඡායාරූපයට පෙනී සිටිය යුතුය. මෙහිදී ඡායාරූප ලබා ගැනීම සම්බන්ධව මේ සමග ඇති ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

12 සියලු උපාධිධාරීන් සහ අමුත්තන් COVID 19 වැලැක්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශ විසින් පනවා ඇති විධිවිධාන පිළිපැදිය යුතුය. මේ සමග අමුණා ඇති සෞඛ්‍ය ප්‍රකාශ පත්‍රිකාව සියලු උපාධිධාරීන් සහ අමුත්තන් විසින් සම්පූර්ණ කර භාර දීම අනිවාර්යවන අතර COVID 19 වැලැක්වීම සඳහා වන එන්නත් මාත්‍රා ලබා ගත් බව සඳහන් කාඩ්පත ඉදිරිපත් කළ යුතු බවද කාරුණිකව දන්වමි.

තවද ඔබ උණ, සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝග තත්වයන්ගෙන් පෙලෙන්නේ නම් උපාධි උත්සවයට පැමිණීමෙන් වැළැකී සිටින ලෙස කාරුණිකව ඉල්ලමි.

ස්තුතියි

මෙයට විශ්වාසී

වැඩ බලන ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
විභාග